# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2078/27 - 2018 ජූලි මස 03 වැනි අඟහරුවාදා - 2018.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**
92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංකඃ 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවූෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගම්පහ අත්තනගල්ල හා මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ තුළුමං පොම්පාගාරය හා ඊට අදාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවූෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය,

2018 ජුනි මස 14 වැනි දින,
අංක ඃ 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1383

1A- G 27995 - 34 (2018/07)
*මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක : 365 - C කරස්නාගල - දකුණ ග්‍රාම නිලධාරි වසමේ කරස්නාගල ගමේ පිහිටි බලුදංගොල්ල කැලේ නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 1 ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස.

*උතුරට* : බස්නාගොඩ ඔය සහ කුරුණෑගල වැව්ලි සමාගම හිමිකම් කියන ගොරොක්කොටුව වත්ත ඉඩම.
*නැගෙනහිරට* : කේ. ඒ. සුනිල් හිමිකම් කියන බලුදංගොල්ලකැලේ ඉඩම.
*දකුණට* : බලුදංගොල්ලකැලේ පොදු සුසාන භූමිය.
*බටහිරට* : කුරුණෑගල වැව්ලි සමාගම හිමිකම් කියන ගොරොක්කොටුව වත්ත ඉඩම.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. ආර්. ඒ. පියසේන මයා,
කරස්නාගල,
වේයන්ගොඩ.

07-554

---

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත
92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංකː 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවූෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දෙහිවල - ගල්කිස්ස අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංකː 04 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවූෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය,

2018 ජුනි මස 14 වැනි දින,
අංක : 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යංශයේ දී ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක : 535 A, බෙල්ලන්විල ග්‍රාම නිලධාරි වසමේ බෙල්ලන්විල ගමේ, විහාර මාවතේ, අංක : 145 දරන ඉඩමට යාබදව පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 6 පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස.

*උතුරට* : අංක : 145 දරන ඉඩම
*නැගෙනහිරට*: ඇවිදීමේ මංතීරුව
*දකුණට* : හිමිකරුවකු නොදන්නා හිස් ඉඩම
*බටහිරට* : විහාර මාවත

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : සොයාගත නොහැක.

07-555

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංකඃ 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවූෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දෙහිවල - ගල්කිස්ස අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංකඃ 06 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවූෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය,

2018 ජුනි මස 14 වැනි දින,
අංක ඃ 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ඃ 538, කළුබෝවිල ග්‍රාම නිලධාරී වසමේ කළුබෝවිල ගමේ, රත්නාවලි පාරේ පිහිටි අංක ඃ 19 දරන නිවාස ඉඩමට යාබදව පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 3 ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස.

*උතුරට* ඃ අංක ඃ 19 දරන නිවාස ඉඩම
*නැගෙනහිරට* ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස
*දකුණට* ඃ පැල තවාන් ඉඩම
*බටහිරට* ඃ රත්නාවලී පාර

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් ඃ සොයාගත නොහැක.

07-556